ශීර්ෂය 104 - ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය
-----------------------------------------------------------------------------------------------------------

ශීර්ෂය 104 - ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා,පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමණාකරණ විගණන වාර්තාව 2016 සැප්තැම්බර් 08 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

**------------------------------------------------------------------------------------------**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකිම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරිම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

2. ගිණුම්

--------

2.1 විසර්ජන ගිණුම

-------------------

මුළු ප්‍රතිපාදනය හා වියදම

----------------------------

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 15,382.31 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 12,826.10 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2,556.21 ක් හෙවත් සියයට 16.62 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 2,120.69 | 1,925.38 | 195.31 | 9.21 |
| මූලධන | 13,261.62 | 10,900.72 | 2,360.90 | 17.80 |
| **එකතුව** | **15,382.31** | **12,826.10** | **2,556.21** | **16.62** |

**2.2** අත්තිකාරම් ගිණුම්

----------------------

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**------------------------------------------------**

පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

---------------------------------------------------

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 10401 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 190.00 | 184.02 | 105.60 | 195.26 | 400.00 | 170.79 |

**2.3** **විගණන නිරීක්ෂණය**

**-----------------------**

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3.** **ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ**

**----------------------------------------**

**3.1** **පොදු තැන්පත් ගිණුම**

**-------------------------**

2015 ජූලි 17 දිනැති අංක සීඑස්ජ්/1/1/92 දරන ජනාධිපති ලේකම්ගේ ලිපිය අනුව අමාත්‍යවරුන්ට ලබාදුන් වාහන වෙනුවෙන් 2015 අගෝස්තු 04 දින මාසික ගාස්තු වශයෙන් ලබා ගනු ලැබූ රු.600,000 ක් අමාත්‍යාංශය විසින් ඉහත විධිවිධාන අනුව රාජ්‍ය ආදායමට බැර නොකර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

**3.2** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**-----------------------------------------------**

විෂය අංක 10401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.7,774,633 ක් වූ අතර එම ණය ශේෂයන් වර්ෂ 01 ක සිට වර්ෂ 16 ක් දක්වා කාල පරාසයකට සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ 2015 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

**3.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කර භාණ්ඩ හා සේවා ලබා ගැනිමට වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව රු. මිලියන 948.7 ක ප්‍රතිපාදන  සලසා තිබුණි. 2006 මාර්තු 28 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**3.4 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරික්ෂණවලදි නිරික්ෂණය වූ නිති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|
| | රු. | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| මුදල් රෙගුලාසි 104 | 729,610 | මෝටර් රථ අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ | | |
| (i) 2015 ජුලි 20 දිනැති අංක සීඑස්ඒ/1/1/92 දරන චක්‍රලේඛය | - | කිසිඳු ගෙවීමකින් හෝ අනුමැතියකින් තොරව අමාත්‍යාංශය සතු මෝටර් රථ දෙකක් පාර්ලිමේන්තු මහා මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා යොදවා ගෙන තිබුණි. |
| (ii) 2015 ජුනි 29 දිනැති අංක SB/02/01 දරන චක්‍රලේඛය | | පිරිවැය මිලියන 41 ක් වූ තවදුරටත් භාර නොදුන් වාහන 03 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

**3.5 විදේශාධාර ව්‍යාපෘති**

දෙවන ප්‍රජා සංවර්ධන සහ ජීවනෝපාය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට (ගැමිදිරිය ව්‍යාපෘතිය) අදාළව ලෝක බැංකුව විසින් සපයන ලද  එක්සත් ජනපද ඩොලර් මිලියන 75 ක් ඇතුළුව  එක්සත් ජනපද ඩොලර් මිලියන 105 ක සම්පූර්ණ ආයෝජනයක්  කර තිබුණි. 2009 ඔක්තෝබර් 22 දින සිට 2014 සැප්තැම්බර් 31 දින දක්වා කාලය තුළ වියදම් කරන ලද එක්සත් ජනපද ඩොලර් 170,213.76 ක් (රු.22,459,700)  වැය කර තිබුණි. එම වියදම් ලෝක බැංකුව විසින් සුදුසුකම් නොලද වියදම් ලෙස 2015 වර්ෂයේදී ලෝක බැංකුවේ භාරකාර නිරික්ෂන වාර්තාවෙන් පෙන්වා දී තිබුණි. ඒ අනුව එම සම්පූර්ණ වියදම නැවත ලෝක බැංකුව වෙත ගෙවීමටත්, එම සුදුසුකම් නොලද වියදම් සම්බන්ධයෙන්  අභ්‍යන්තර පරීක්ෂණයක්

පැවැත්වීමටත් අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි. එම සුදුසුකම් නොලත් ගෙවීම් 2016 වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීමක් මගින් ප්‍රතිපාදන ලබා ගෙන ගෙවා තිබුණි. නමුත් එම ගෙවීම් සම්බන්ධව අභ්‍යන්තර පරීක්ෂණයක් පවත්වා නොතිබුණි.

**3.6 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 72 | 62 | 13 | 3 |
| (ii) | තෘතියික මට්ටම | 154 | 97 | 57 | - |
| (iii) | ද්විතියික මට්ටම | 209 | 222 | 5 | 18 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 105 | 63 | 42 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත්) | 04 | 01 | 03 | - |
| | එකතුව | 544 | 445 | 120 | 21 |

ජ්‍යෝෂ්ඨ මට්ටමේ තනතුරුවල 03 ක් හා ද්විතියික මට්ටමේ තනතුරුවල 18 ක් ඇතුළුව 21 දෙනෙකුගේ අතිරික්ත සේවක සංඛ්‍යාවක් නිරීක්ෂණය විය. බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව සඳහා විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.